# 06 ද්විතීයික වෙළෙඳපොළේ (Secondary Market) ගණුදෙනු කිරීම

ප්‍රාථමික වෙළෙඳපොළින් ලබාගත් කොටස් නැවතත් එකිනෙක පුද්ගලයන් අතර ගණුදෙනු වන අවස්ථාවක්/තත්ත්වයක් ද්විතීයික වෙළෙඳපොළ ලෙස හඳුනා ගත හැක. ශ්‍රී ලංකාව තුළ මෙම ද්විතීයික වෙළෙඳපොළ ගණුදෙනු නීත්‍යානුකූලව සිදු කෙරෙන්නේ කොළඹ කොටස් හුවමාරුව තුළය. කොළඹ කොටස් හුවමාරුව කොළඹ 01 ලෝක වෙළෙඳ මධ්‍යස්ථාන පරිශ්‍රයේ පිහිටා ඇත. මෙම ද්විතීයික වෙළෙඳපොළ ගණුදෙනු තවදුරටත් ප්‍රාදේශීයව ව්‍යාප්ත කරමින් කොළඹ කොටස් හුවමාරුව මාතර, මහනුවර, කුරුණෑගල, මීගමුව සහ යාපනය යන නගරවල ශාඛා ආරම්භ කර ඇත. ඒ අනුව මෙම ද්විතීයික වෙළෙඳපොළ ගණුදෙනුවලට අදාළ කරුණු කිහිපයක් සරලව මෙසේ ඉදිරිපත් කළ හැකිය.

- ප්‍රාථමික වෙළෙඳපොළේ දී එනම් සමාගමක් ප්‍රථම වතාවට කොටස් නිකුත් කිරීමක දී කොටස් මිලදී ගැනීම පමණක් සිදු වුවද ද්විතීයික වෙළෙඳපොළ තුළදී කොටස් මිලදී ගැනීම/විකිණීම යන අංශ දෙකම ක්‍රියාත්මක වේ.
- ද්විතීයික වෙළෙඳපොළින් කොටස් මිලදී ගැනීමේ දී මධ්‍යම තැන්පතු ගිණුමක් (CDS Account) විවෘත කිරීම අනිවාර්යයෙන්ම සිදුකළ යුතුයි. මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS) පිළිබඳව ඉදිරි පරිච්ඡේද වලදී සාකච්ඡා කෙරේ. මෙම ගිණුම් ආරම්භ කිරීම සඳහා කොළඹ කොටස් හුවමාරුවේ ලියාපදිංචි තැරැව්කාර සමාගමක් (Stockbroking Company) වෙත යා යුතුය. මෙම තැරැව්කාර සමාගම් සහ ඒවායේ කාර්යභාරය පිළිබඳව ඉදිරියේදී කරුණු දැක්වේ.
- කොටස් වෙළෙඳපොළ ගණුදෙනු ආරම්භ කිරීමේ මූලික අවස්ථාව එය බව අප මෙම ලිපියෙහි මුලින්ම සඳහන් කළෙමු. මෙසේ ගිණුමක් ආරම්භ කිරීමට කොටස් තැරැව්කාර සමාගමකින් අයදුම්පත්‍රයක් ලබා ගත හැක. අයදුම්පත්‍රය භාරදී දිනක් ඇතුළත ගිණුම විවෘත වේ. මෙම ගිණුම විවෘත කිරීමට මුදල් අය නොකෙරේ.
- ඔබ නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය සමඟ ඔබගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සහ ස්ථිර පදිංචිය සනාථ කිරීම සඳහා අදාළ ලියවිල්ලක්ද (විදුලි බිල්පතක ඡායා පිටපතක්, ජල බිල්පතක ඡායා පිටපතක්, දුරකථන බිල්පතක ඡායා පිටපතක් ආදී...) කොටස් තැරැව්කාර ආයතනය වෙත භාර දිය යුතුය.

- මෙම ලියවිලි භාරදී එදිනම වුවද ඔබගේ නමින් (ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකයට) කොළඹ කොටස් හුවමාරුවේ නොමිලයේ ගිණුමක් ආරම්භකර ගත හැකිය. එය CDS ගිණුම නැතහොත් කොටස් ගිණුම ලෙස හැඳින්වේ.
- CDS ගිණුමේ ගනුදෙනු වනුයේ කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තු ගත සමාගම්වල කොටස් පමණි. එනම් මෙම ගිණුමේ මුදල් ගණුදෙනු කිසිවක් සිදු නොවේ. කොටස් ගණුදෙනු සම්බන්ධයෙන් වූ සියළු ගණුදෙනු සිදු කෙරෙනුයේ මෙම ගිණුම හරහාය.

### ගිණුම ආරම්භ වීමෙන් පසු පියවර

- ඔබට තැරැව්කාර සමාගම විසින් ලබාදෙන ආයෝජන උපදේශකවරයා කවුද යන්න ප්‍රථමයෙන් සොයා බැලිය යුතුයි. එමෙන්ම ඔහු හෝ ඇය ලියාපදිංචි ආයෝජන උපදේශකයෙකුද (Registered Investment Advisor-RIA) යන්න ඔබ සොයා බැලිය යුතුය. ඒ පිළිබඳව තැරැව්කාර ආයතනයෙන් දැන ගත හැකිය.
- ඔබට මුලින්ම ආයෝජනය කළ හැකි මුදල හෝ ඉන් අඩක් තැරැව්කාර සමාගම වෙත ලබාදී රිසිට් පතක් ලබා ගත හැකිය. ඔබ සම්පූර්ණ මුදල් ලබා නොදුන්නහොත් ඔබ මිලදී ගත් කොටස් සඳහා ඒ මුළු මුදල ගෙවිය යුත්තේ කොටස් මිලයට ගෙන දින 3 ක් ඇතුළතය. (T+3). ඒ පිළිබඳ වැඩි විස්තර මෙම ලිපියේ ඉදිරියේ දී සාකච්ඡා කෙරේ.
- කොටස් මිලදී ගැනීමේදී/විකිණීමේදී කොටස් වෙළෙඳපොළ පිළිබඳ යම්කිසි දැනුමක් ඔබ සතු විය යුතුය. එසේ දැනුමක් නොමැති නම් වෙළෙඳපොළට පිවිසීමට ප්‍රථමව ඒ දැනුම ලබා ගත යුතුය. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව (SEC) මගින් පවත්වන විවිධ ආයෝජක වැඩසටහන්, රූපවාහිනී වැඩසටහන්, එමගින් පළ කරනු ලබන විවිධ ලිපි මගින් මෙන්ම කොටස් වෙළෙඳපොළ සහ එහි ශාඛා ජාලය, කොටස් තැරැව්කාර ආයතන සහ ඒවායේ ශාඛා මගින් සංවිධානය කරන විවිධ වැඩසටහන්වලට සහභාගී වීමෙන් මෙම දැනුම ලබා ගත හැකිය.
- කොටස් තැරැව්කාර ආයතන විශාල සංඛ්‍යාවක සමීක්ෂණ අංශ පවතින බැවින් ඔවුන් නිරන්තරයෙන් කොටස් වෙළෙඳපොළ, කොටස් වෙළෙඳපොළේ ඇති සමාගම්, සමාගම් අයත් ව්‍යාපාර ක්ෂේත්‍ර, ආර්ථිකය ඇතුළු විවිධ කරුණු පිළිබඳව සමීක්ෂණ සිදු කරනු ලබයි. එම දත්ත පදනම් කරගෙන ඔවුන් ඔබ හට කොටස් මිලයට ගැනීමට නැතහොත් තමන් ළඟ ඇති කොටස් විකිණීමට නිර්දේශ කරනු ලබයි.

- ඔබ හට තැරැව්කාර ආයතනය කුමන නිර්දේශ සිදු කළත් ඒ පිළිබඳව අවසාන තීරණය ගත යුත්තේ ඔබ විසිනුයි. ආයෝජකයා වශයෙන් ඔබ තමන් මිලදී ගත යුත්තේ කුමන සමාගමක කොටස් ද යන්න තීරණය කළ යුතු අතර තැරැව්කාර ආයතනයේ උපදේශ ඒ සඳහා පාදක කර ගත හැක.
- ඔබ විසින් මතක තබා ගත යුතු ඉතා වැදගත් කරුණක් නම් ඔබ විසින් රු. 10,000 කට (උදාහරණයක් වශයෙන්) කොටස් මිලදී ගැනීමට බලාපොරොත්තු වන්නේ නම් ඒ මුළු මුදල් ප්‍රමාණය ඔබ සතුව තිබිය යුතු බවයි. ණයට කොටස් මිලදී ගැනීමට පෙළඹීම ඉතා අවදානම් කටයුත්තකි.
- ඔබ විසින් කොටස් මිලදී ගැනීමට බලාපොරොත්තු වන සමාගම කුමක්ද යන්න පැහැදිව ආයෝජන උපදේශක වෙත පැවසිය යුතුයි.
- කොටස් වෙළෙඳපොළේ ලයිස්තුගත සමාගම් සෑම එකක්ම එක හා සමාන සමාගම් නොවන බව ඔබ වටහා ගත යුතුය. එනම් දැනට කොටස් හුවමාරුවේ ලයිස්තු ගත සමාගම් 284 ක් පමණ ඇති අතර ඒවා මහා පරිමාණ, මධ්‍ය පරිමාණ හෝ කුඩා පරිමාණ සමාගම් ලෙස හඳුනා ගත හැක.
- ඒ අනුව ඔබ මිලදී ගැනීමට බලාපොරොත්තු වන්නේ මෙම කුමන තරාතිරමක සමාගම්වල කොටස් ද යන්නත් එවැනි සමාගම් වල නිෂ්පාදනයන් මොනවාද යන්නත් දැන ගැනීමත් ඉතා වැදගත් වේ. එමෙන්ම එම සමාගමේ නිෂ්පාදනයට ඇති ඉල්ලුම හා සැපයුම කෙසේද, ලාභ ලබන සමාගමක් ද, යන්න දැනගැනීමත් ඔබගේ ආයෝජනයේ වටිනාකම ඉහළ නංවා ගැනීමට උපකාරීවේ.
- ඉහත අයුරින් සමාගම පිළිබඳව අවබෝධයක් ලබාගැනීමෙන් පසු කොටස් මිලදී ගැනීමට ඇණවුම භාරදීමේ දී ඔබ මිලදී ගැනීමට බලාපොරොත්තු වන කොටස් ප්‍රමාණය සහ කොටසක මිල තැරැව්කරුට ලබාදිය යුතුය.
- මෙහිදී තමන්ට සමාගමේ කොටසක මිල පිළිබඳව අවබෝධය අඩුනම් තැරැව්කාර සමාගමේ ඔබගේ ආයෝජන උපදේශකවරයාගෙන් උපදෙස් පැතිය හැකිය. එය තවදුරටත් පැහැදිලි කළහොත් සමාගමක පවතින මිල සාධාරණ ද, එය අනාගතයේදී තවදුරටත් ඉහළ යයි ද නැතහොත් පහළ යයි ද පවතින මිලට ගණුදෙනු කිරීම සුදුසු ද යන්න අසා පැහැදිලි කර ගත හැකිය.
- ඒ අනුව ඔබ මිලදී ගැනීමට/විකිණීමට බලාපොරොත්තු වන කොටස් සඳහා ඇණවුම් ලබාදීමෙන් අනතුරුව එම කොටස් ඔබට ලැබුණහොත්

එසේත් නැත්නම් කොටස් අලෙවි වුවහොත් ඒ බව සනාථ කරමින් ඊට අදාළ ගැනුම් සටහනක් (Bought note) හෝ විකුණුම් සටහනක් (Sold note) ඔබ වෙත ගණුදෙනු දිනට පසු දින ලැබෙනු ඇත. එය තැපැල් මගින් හෝ ඊමේල් මගින් ඔබ වෙත ලැබීමට කටයුතු සැළැස් වේ.

- මෙම ගැනුම් සටහනේ හෝ විකුණුම් සටහනේ ඔබ හාරදුන් ඇණවුම ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මකවී ද යන්න ඔබට තහවුරු කර ගත හැකිය. එහි ඔබ මිලදීගත්/විකුණන ලද කොටසක මිල, කොටස් ප්‍රමාණය, සහ ගණුදෙනුවට අදාළ තැරැව්කාර ගාස්තු සඳහන් වේ.
- එමෙන්ම ඔබ දැනට රැකියාව කරන්නේ, පදිංචිව සිටින්නේ ඔබගේ තැරැව්කාර සමාගමට දුරින් නම් එම තැරැව්කාර සමාගමේ ඔබ වෙත ලබා දී ඇති ගිණුමකට වුව ද මුදල් බැර කළ හැකිය. ඒ සඳහා ඔබ තැරැව්කාර සමාගම වෙත යා යුතුම නැත.
- මෙසේ ඔබ මිලදී ගත් කොටස් විකුණා ගැනීමට ද ඉහත ආකාරයෙන්ම ඇණවුම් තැරැව්කාර සමාගම වෙත භාරදිය හැකිය.

**අන්තර්ජාලය තුළින් ගණුදෙනු කිරීම**

- ඉහතින් සාකච්ඡා කළ ද්විතීයික වෙළෙඳපොළ ගණුදෙනු ආයෝජකයන්ට තවදුරටත් සමීප කරමින් වසර කිහිපයකට පෙර දී කොළඹ කොටස් හුවමාරුව අන්තර්ජාල ගණුදෙනු පහසුකම් හඳුන්වා දෙනු ලැබීය.
- ඒ අනුව කාර්ය බහුල ආයෝජකයින්ට තම ගණුදෙනු නිදහසේ තම නිවසේ සිටම එසේ නැතහොත් තම සේවා ස්ථානයේ හෝ ව්‍යාපාරික ස්ථානයේ සිටම සිදු කිරීමට අවස්ථාව උදා විය.
- දැනට කොටස් තැරැව්කාර සමාගම් විශාල සංඛ්‍යාවක් මෙම ගණුදෙනු පහසුකම් සපයන අතර ඒ යටතේ ලියාපදිංචි ආයෝජකයන්ට මෙම අන්තර්ජාල පහසුකම් ඉල්ලා සිටිය හැකිය.
- මේ අන්තර්ජාල ගණුදෙනු පහසුකම් සඳහා අමතර ගාස්තුවක් අය නොකෙරේ.
- කෙසේ වුව ද මෙම අන්තර්ජාල ගණුදෙනු කිරීමේදී ආයෝජකයා පැහැදිළි අවබෝධයකින් යුතුව කටයුතු කළ යුතුවේ. එනම් කොටස් ආයෝජනය පිළිබඳ හොඳ දැනුමක් මුලින්ම ලබාගත යුතුය.

**ද්විතියික වෙළෙඳපොළ ගණුදෙනු පියවීම**

- ඕනෑම කොටස් මිලදී ගැනීමක් සමඟ විකිණීමක් වෙනුවෙන් ගණුදෙනු බේරුම් කිරීම ගණුදෙනුව සිදු කළ දින සිට ඉදිරි වෙළෙඳපොළ දින 3 ක් (T+3) ඇතුළත සිදු කළ යුතුය.

- එය තවදුරටත් පැහැදිලි කළහොත් ඔබ තැරැව්කාර සමාගමේ ආයෝජන උපදේශකවරයා වෙත ලබාදුන් මුදල් ප්‍රමාණයට වඩා වැඩි වටිනාකමක් සඳහා කොටස් මිලදී ගත්තේ නම් ඒ සඳහා ගණුදෙනු දිනය හැර ඉදිරි වෙළෙඳපොළ දින 3 ක් ලබා දේ. එමෙන්ම ඔබ කොටස් විකිණීමක් සිදු කළේ නම් කොටස් විකිණූ දින සිට ඉදිරි දින තුනක් ඇතුළත විකිණීමට අදාළ තැරැව්කාර ගාස්තු අඩු කිරීමෙන් පසු ඉතිරි මුදල ඔබට චෙක්පතකින් ලබාදේ.
- කෙසේ වෙතත් ප්‍රථම වරට ආයෝජනය කරන පුද්ගලයෙකුට කොටස් මිලදී ගැනීමට ප්‍රථමයෙන් අත්තිකාරම් මුදලක් ගෙවීමට තැරැව්කාර සමාගම විසින් ඉල්ලා සිටිය හැක.

**කොටස් ළඟ තබා ගැනීම**

- ආයෝජකයකු මිලට ගත් කොටස් ඔහු විසින් තීරණය කළ කාලයක් සඳහා තම ගිණුමේ රඳවා තැබිය හැකිය.
- බොහෝ කොටස් වෙළෙඳපොළ ප්‍රතිලාභ ලැබෙනුයේ දිගුකාලීනව නිසා මෙසේ කොටස් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. එහෙත් කෙටිකාලීනව කොටස් වෙළෙඳපොළේ ගණුදෙනු කිරීමත් ඉන් ප්‍රතිලාභ ලැබීමටත් නොහැකිය යන්න මින් අදහස් නොවේ.
- ද්විතීයික වෙළෙඳපොළ ගණුදෙනුවල දී ආයෝජකයකු මතක තබා ගත යුතු වැදගත් කරුණක් වන්නේ හැකි තරම් පහළ මිලකින් කොටස් මිලට ගෙන තමා සෑහීමකට පත් වන මට්ටමකට මිල ඉහළ ගිය පසු විකුණා ගැනීමයි.
- මෙම සියළුම ආයෝජන තීරණ ගනු ලබන්නේ ආයෝජකයා විසින්මය.
- මෙම තීරණ ගැනීමේ දී ආයෝජකයකුට තැරැව්කාර ආයතන විසින් නිකුත් කරනු ලබන පර්යේෂණ වාර්තා ඉතා වැදගත් වේ. මෙම වාර්තාවන් හී සඳහන් තොරතුරු ආයෝජකයාහට තේරුම් ගැනීමට අපහසු නම් වඩාත් සුදුසුම වන්නේ ආයෝජන උපදේශකගේ සහයෝගය ලබාගැනීමයි.
- නමුත් මෙම ද්විතීයික වෙළෙඳපොළ ගණුදෙනු වලදී දැකගත හැකි කරුණක් වන්නේ සමහර ආයෝජකයින් තම කාර්යබහුලතාවය නිසා තම ගිණුම හැසිරවීමේ බලය තැරැව්කාර සමාගම වෙත පවරා දී ඉදිරි ගණුදෙනු කරගෙන යන ලෙස උපදෙස් දීමයි. එය සිදුකළ හැක්කක් වුව ද ආයෝජන උපදේශකවරයාට රිසිසේ ගණුදෙනු කිරීමට ඉඩ නොහැර ආයෝජකයා ද තම ගිණුමේ ගණුදෙනු පිළිබඳ නිරන්තර විමසිල්ලෙන් සිටීම ඉතා වැදගත් වේ.

- කොටස් මිලදී ගැනීමට විකිණීමට හෝ කොටස් ගනුදෙනු හා බැඳුනු අනෙකුත් කාරණා සම්බන්ධයෙන් ඔබගේ තැරැව්කරු හා සම්බන්ධ විමට පහත ක්‍රම අනුගමනය කළ හැකිය. එනම්
    - දුරකථන
    - ෆැක්ස්
    - ඊ-මේල්
    - පුද්ගලිකව හමුවීමෙන්
    - අන්තර්ජාලය යන මාර්ගවලින් ඕනෑම එකක් භාවිතා කළ හැකිය.
- මධ්‍යම තැන්පතු ක්‍රමය විසින් සෑම ගණුදෙනු කරුවෙකුටම මාසික ගිණුම් වාර්තාවක් යොමු කෙරේ. මෙම වාර්තාව ලැබෙනුයේ එකී ගිණුම්හී අදාළ මාසය තුළ එක් ගනුදෙනුවක් (මිලදී ගැනීමක්, විකිණීමක්, කොටස් තැන්පත් කිරීමක්, ආපසු ගැනීමක් හෝ කොටස් පැවරීමක්) හෝ සිදු වි ඇත්නම් පමණි. මෙසේ මසක් තුළ එක් ගණුදෙනුවක් හෝ සිදුවන ගිණුම් සක්‍රීය ගිණුම් ලෙස ද හැඳින්වේ.
- ඕනෑම ආයෝජකයකුට තම තැරැව්කාර සමාගම අවශ්‍ය ඕනෑම විටෙක වෙනස් කර ගැනීමට හැකියාව ඇති අතර තැරැව්කාර ආයතන කිහිපයක් තුළ CDS ගිණුම් කිහිපයක් වුවද ආරම්භ කළ හැකිය. එමෙන්ම තනි පුද්ගල ගිණුම් හෝ හවුල් ගිණුම් හෝ විවෘත කිරීමට ද අවකාශ ඇත.
- ද්විතියික වෙළෙඳපොළ ගණුදෙනුවලදී තවත් සැලිකිලිමත් විය යුතු කරුණක් වන්නේ දෛනික කොටස් මිල ගණන් සහ සමස්ත වෙළෙඳපොළ හැසිරීම පිළිබඳ දළ අවබෝධයක් ලබා ගැනීමයි.
- ඒ සඳහා වඩාත් පහසුවෙන් භාවිතා කළ හැකි ක්‍රම කිහිපයක් වන අතර තැරැව්කාර ආයතනය ඇමතීම, දිනපතා පුවත්පත් බැලීම, කොළඹ කොටස් වෙළෙඳපොළ වෙබ් අඩවියට පිවිසීම, කොටස් වෙළෙඳපොළ ශාඛා කොටස් තැරැව්කාර ආයතනයේ ශාඛා වෙත යාම යනාදි ක්‍රම අනුගමනය කළ හැක. කොළඹ කොටස් වෙළෙඳපොළේ ශාඛා මාතර, මහනුවර, කුරුණෑගල, මීගමුව හා යාපනය යන නගරවල ස්ථාපිත කොට ඇති අතර තැරැව්කාර සමාගම් ද එම ශාඛා තුළත් ඉන් පිටත ලංකාවේ ප්‍රධාන නගර කේන්ද්‍ර කොටගෙන පිහිටුවා ඇත.